L 19

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016-08-12 |

පැමිණිලිකාරිය : බී. ප්‍රදීපා කුමාරි මිය.
නො: 226/බී. විජයරාම පාර.
බොල්ලෑගල. ගෝනවල.

උක්ත අතෘප්තියට පත් තැනැත්තා - පී.එච් ප්‍රවීන් සචින්ත

වගඋත්තරකරු/වන් : විදුහල්පති.
ශ්‍රී ධර්මාලෝක විද්‍යාලය.
වරාගොඩ. කැලණිය.

පැමිණිලි අංකය : **HRC/2124/16/I-23**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, උක්ත අතෘප්තියට පත් තැනැත්තා වන තම පුතා ශ්‍රී ධර්මාලෝක විද්‍යාලයේ 12 ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ බවත්, 2016.04.03 දින මහා ක්‍රිකට් තරග දින තම මිතුරන් සමග දුම්වැටි පානය කළ බවට චෝදනා කර විදුහල්පතිවරයා විසින් මේ දක්වා පන්ති තහනම් කර ඇති බවත්ය.

තමා මේ සම්බන්ධයෙන් සිදුවනාවක් විදුහල්පති වෙතින් විමසූ විට "කරදර නොකරන ලෙසට හා දැන් අස්වීම දෙන්නදැයි" විමසූ බවත්, තම ස්වාමිපුරුෂයා එම එක් දිනක් විදුහල්පතිට වැද තම පුතාට පාසලට පැමිණීමට ඉඩ දෙන ලෙස ඉල්ලූ බවත්, තමා මෙම සිද්ධිය වූ දින මාළිගාවත්ත පොලිස් ස්ථානයට ගිය අතර එහිදී " ළමයා වරදක් කරලා නෑ පාසලෙන් අස් කරන එකක් නැහැ, මම විදුහල්පතිට කිවුවා" යනුවෙන් පොලිස් ස්ථානාධිපතිවරයා විසින් තමාට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165,කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர்: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு: 011-2689558, 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

තමා මේ පිළිබඳ ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත යොමු වූ බවත්,නමුත් එදින විවිධ නිලධාරීන් වෙත තමාව යොමු කර පසුව "වාර්තාවක් කැඳවා දන්වන බව" පැවසීම මත තමා ලිඛිතව ලබා දුන් පැමිණිල්ලද රැගෙන නැවත පැමිණි බවත් සඳහන් කර ඇත. තම දරුවා ගණිත අංශයෙන් අධ්‍යාපනය ලබන අතර ඔහු 1 වසරේ සිට උසස් පෙළ දක්වාම ධර්මාලෝක විද්‍යාලයේ ඉගෙනුම ලැබූ ශිෂ්‍යත්වය සමත් වූ දරුවෙකු බවත්, පාසලේ බාහිර ක්‍රියාකාරකම් වන මූර්ති හා චිත්‍ර සම්බන්ධයෙන්, නැටුම් අංශයෙන් ඉදිරියෙන් ඉන්නා බවත්, ශිෂ්‍ය නායකයෙකු ලෙස කටයුතු කළ බවත් වැඩිදුරටත් දක්වා ඇ

එසේම තම දරුවා 2017 අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින බැවින්, කඩිනමින් පාසල් යාමට අවස්ථාව සලසා දෙන ලෙස මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවයේ ලිඛිත කරුණු දැක්වීම :-**

2016 වාර්ෂික මහා ක්‍රිකට් තරගය 2016.04.03 දින පැවැත්වූ බවත්, එදින තරගය පැවැත්වෙන අතරතුර තම විදුහලේ ශිෂ්‍යයෙකු හා තවත් අයෙකු මත්ද්‍රව්‍ය (ගංජා) සමග අත්අඩංගුවට ගත් බවට හා එහිදී ප්‍රසිද්ධියේ පොලිස් නිලධාරීන්ට බැණ වැදී බහින් බස්වී පොලීසිය අපකීර්තියට පත් වන ආකාරයට හැසුරුණු බවට මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරියෙක් විසින් තමාට පැමිණිලි කරන ලද බවට සඳහන් කර ඇත. ඒ අනුව තමා විසින් මේ පිළිබඳ සොයා බැලීමට විදුහලේ ආචාර්ය මණ්ඩලයේ දෙදෙනෙක් පොලිස් ස්ථානයට යොමු කළ බවත්, එම සිසුන් මත්වී පොලිස් ස්ථානයේ සිට ඇති අතර පසුව තමා පොලිස් නිලධාරීන්ට කථා කර, ඔවුනට අවවාද කොට අදාල දෙමාපියන්ට භාර දෙන ලෙසට දන්වන ලද බවත්, සඳහන් කර ඇත.

මෙම සිදුවීමත් සමග ආදි සිසුන්, දෙමාපියන් අතර මෙම සිද්ධිය කථාබහට ලක් වූ බවත්, තමාගෙන් කීපදෙනෙකු මෙම අනිසි හැසිරීම පිළිබඳව විමසූ බවත්, මෙම හැසිරීම හේතුවෙන් පාසලේ නාමය අපකීර්තියට පත් වීම, ගුරු මණ්ඩලය අපකීර්තියට පත්කිරීම, පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම හා ඔවුන් අපකීර්තියට පත් කිරීම, ශිෂ්‍යයන් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම නිසා පෞරුෂයට හානිවීම වූ බවත් ඒ අනුව මේ සම්බන්ධයෙන් පැමිණිලිකාරිය සමග සාකච්ඡා කළ බවත් සඳහන් කර ඇත.

එහිදී දරුවාගේ පාසල් පරිසරය වෙනස් කිරීමට, එනම් වෙනත් පාසලකට යොමු කිරීමට කටයුතු කරන ලෙස පාර්ශවයට දැනුම් දුන් බවත්, එසේම දරුවා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වළක්වා ගැනීම සඳහා ඔහු ඇසුරු කරන අයගෙන් ඈත් කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දුන් බවත්.

මෙම ක්‍රියාමාර්ග නොගතහොත් පාසලෙහි තරුණ දරුවන් පාලනය කරගත නොහැකිවීම. දෙමාපියන් හා පාසල් ප්‍රජාවගේ දැඩි විවේචනය පාසල වෙත හා තමා වෙත එල්ලවීම. එය අනෙක් දරුවන්ට කරන අනතුරක් වීම. මත්ද්‍රව්‍ය භාවිතයෙන් දරුවා ඈත්කර ගැනීමට නොහැකිවීම වැනි බොහෝ අකටයුතුකම් සිදු වන බවට දැනුවත් කරන ලද බවත් සඳහන් කර ඇත.

ඒ අනුව මෙම කරුණු සලකා බලා වෙනත් පාසලක් වෙත මෙම දරුවා ඇතුලත් කර ගැනීමට කටයුතු කරන ලෙස දෙමාපියන්ට දැනුම් දුන් බවත්, දරුවාගේ චරිතයට හානිවන කිසිම කටයුත්තක් තමා විසින් නොකළ බවත්, පන්ති තහනමකට ලක් කොට නොමැති බවත් වගඋත්තරකරු විසින් වැඩිදුරටත් දන්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනය සහ නිරීක්ෂණ :-**

පැමිණිලිකාරිය කොමිෂන් සභාවේ පැමිණිලි කරමින් දක්වා ඇත්තේ තම දරුවා එන අතෘප්තියට පත් තැනැත්තතාට පාසල් ශිෂ්‍යයකු ලෙස සිදුවූ සිදුවීමක් හේතුකොටගෙන 2016.04.03 දින සිට මේ දක්වා (2016.06.27) පාසලට ඒමට වගඋත්තරකරු විසින් ඉඩ නොදෙන බවයි.

ඒ අනුව මේ සම්බන්ධව සිදුකරන ද විමර්ශනයේදී පහත කරුණු නිරීක්ෂණය වි ඇත.

1. 2016.04.03 දින පැවති වාර්ෂික මහ ක්‍රිකට් තරගයේදී අතෘප්තියට පත් තැනැත්තා පොලිස් ස්ථානය වෙත ගෙන ගොස් ඇති අතර වගඋත්තර පාර්ශවයට අනුව ගංජා මිශ්‍ර දුම්වැටියක් පානය කිරීම නිසා එසේ අත්අඩංගුවට පත් වූ බව දක්වා ඇත. පැමිණිලි පාර්ශවයට අනුව දුම්වැටි භාවිතය නිසා අත්අඩංගුවට ගත් බවට කරුණු නිරීක්ෂණය වී ඇත.

2. නමුත් ඒ පිළිබඳ සනාථ කිරීමට කිසිදු පොලිස් සටහනක් හෝ වාර්තාවක් දක්නට නොලැබෙනුයේ පොලිස් ස්ථානය විසින් එම සිසුන් කිසිදු විභාගයකින් හෝ විමර්ශනයකින් තොරව මවුපියන්ට භාර දී තිබීම හේතුවෙන් එන බවද නිරීක්ෂණය වේ.

3. වගඋත්තර පාර්ශවය විසින් ප්‍රදේශයේ බෞද්ධ පාසලක් වූ එම විද්‍යාලේ නාමය අපකීර්තියට පත් කිරීම. ගුරු මණ්ඩලය අපකීර්තියට පත් කිරීම. පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම හා අපකීර්තියට පත් කිරීම. සිසුවා මත්ද්‍රව්‍ය පානය කිරීම හා ප්‍රසිද්ධියේ අනිසි ලෙස හැසිරීම නිසා ඔහුගේ පෞරුෂයට හානිවීම යන කරුණු දක්වා එම සිසුවා වෙනත් පාසලකට යොමු කිරීමට දෙමාපියන්ට දැනුම් දුන් බව 2016.06.27 වාර්තාව අනුව පිළිගෙන ඇති බව නිරීක්ෂණය වේ.

4. මෙම අතෘප්තියට පත් තැනැත්තා මාස 3 කට ආසන්න කාලයක් පාසල් අධ්‍යාපනය නොලැබ සිටින බව විමර්ශනයේදී අනාවරණය වන අතර. එහිදී විනය හේතුවක් මත එම තත්ත්වය ඇතිවූ බව පැහැදිලි වී ඇත.

5. මෙහිදී පාසල තුළ විනය ආරක්ෂා කිරීම සඳහා වූ 2005/17 චක්‍රලේඛනය ප්‍රකාරව වගඋත්තරකරු ක්‍රියාත්මක වූවාද යන්න අවධානයට ලක් කිරීමේදී එම චක්‍රලේඛනය 2.2 හි Vii වන කොටසේ දක්වා ඇති පරිදි බරපතල විනය ක්‍රියාවක් සිදු කළ විට දෙමාපියන්ට දන්වා සති 02 කට නොවැඩි කාලයක් පංන්ති තහනම් කිරීම. ඉහත Vi හා Vii යටතේ ක්‍රියා කිරීමේදී විදුහල්පතිවරයා විසින් පාසල් විනය මණ්ඩලය කැඳවා එමගින් සිදු කරනු ලබන නිසි පරීක්ෂණයකින් පසුව ගනු ලබන තීරණයක් මත පමණක් එසේ කළයුතු බව දක්වා ඇත.

6. එසේම (Viii) කොටසේ දක්වා ඇති පරිදි පාසලේ විනය මණ්ඩලය විසින් ඉතා බරපතල විනය විරෝධී ක්‍රියාවක් සිදු කර ඇති බව තීරණය කරනු ලැබූ අවස්ථාවකදී එම ක්‍රියාවේ ස්වභාවය හා බරපතලකම අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව සති 02කට වැඩි කාලයක් පන්ති තහනම් කිරීම හෝ ළමයා වෙනත් පාසලක ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණියටම මාරු කිරීම කළයුතු බවට දක්වා ඇත.

7. නමුත්. අදාළ වගඋත්තරකරු මෙම චක්‍රලේඛනය අනුව කටයුතු කිරීමකින් තොරව පොලිස් ස්ථානය මගින් මුදාහල සිසුවා සම්බන්ධව තනි තීරණයකට අනුව වෙනත් පාසලකට යොමු කරන ලෙස දෙමාපියන්ට දන්වා ඇති බව නිරීක්ෂණය වේ. ඒ පිළිබඳ කිසිදු විනය පරීක්ෂණයක් නොපැවැත්වූ බව වගඋත්තර පාර්ශවය පරීක්ෂණයේදී පිළිගෙන ඇති අතර. එය නොපැවැත්වූයේ මෙම සිද්ධියට ප්‍රසිද්ධියක් ලැබීම වැළැක්වීමට බව තවදුරටත් දක්වා ඇත. ඒ අනුව වගඋත්තර පාර්ශවය එම සිදු වූ විනය ගැටලුවට අදාළව චක්‍රලේඛන ප්‍රකාරව කටයුතු කර නොමැති බව අවධානයට ලක් වේ.

8. නමුත් වගඋත්තරකාර පාර්ශවය දෙමාපියන්ට පාසලක් සපයා ගැනීමට පැවසීම මත මෙම ශිෂ්‍යා මාස 3 ක පමණ වූ කාලයක පන්ති තහනමක් ව්‍යාංගයෙන් පනවා ඇති බව නිරීක්ෂණය වන අතර. සිසුවා පාසලට යම් කාලයක් නොයෑම නිසාම වැඩි ප්‍රසිද්ධියක් ලැබ් ඇති බව නිරීක්ෂණය වේ.

9. මෙම අත්තනෝමතික තීරණය හේතුවෙන් ගණිත අංශයෙන් 2017 වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුවෙකුට මෙවැනි කාලයක අධ්‍යයන කාලයක් අහිමි වීම අනුමත කළ නොහැකි අතර එය අනියමාර්තයෙන් දඬුවමක් පැනවීමක් හා සමාන වේ.

10. එසේම, මෙම ශිෂ්‍යයා ගණිත අංශයෙන් උසස් පෙළ විභාගය සිදු කරන පාසලේ බාහිර ක්‍රියාකාරකම් වන මූර්ති කලා කටයුතු සහ නැටුම් යන අංශයන්ද පාසලේ ශිෂ්‍ය නායකයෙකු ලෙසද කටයුතු කළ ශිෂ්‍යයෙකු බව පැමිණිලිකාර පාර්ශවය දක්වා සිටි අතර, වගඋත්තරකාර පාර්ශවය එහිදී එම ක්‍රියාකාරකම් ප්‍රතික්ෂේප කිරීමක් සිදුකර නොමැත.

11. ඒ අනුව එවැනි ශිෂ්‍යයෙකු සම්බන්ධව මෙවැනි අත්තනෝමතික ක්‍රියාත්මකවීම තුළින් ඇතිවන මානසික තත්ත්වය හා නිශේධාත්මක තත්ත්වය මැනිය නොහැකි වේ.

12. ගුරුවරුන් යනු ශිෂ්‍යයන්ගේ ස්ථානීය දෙමාපියන් (loco - parent's) නම් වූ නිතිමය සංකල්පයට අනුව ශිෂ්‍යයින්ගේ සුභසිද්ධියට හේතුවන අයුරින් කටයුතු කිරීම සෑම ගුරුවරයෙකුම බැඳී සිටියි. එසේම, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කළ 2012/37 චක්‍රලේඛනයේ ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාවක් දක්වා ඇති අතර. එහිදී ක්ෂේත්‍ර 08 ක් ඔස්සේ අදාළ ආචාර ධර්ම පද්ධති දක්වා ඇත. එහිදී මෙම වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය තුළින් එම චක්‍රලේඛනයේ 5.7 හි දක්වන ගුරුවරයා කළමනාකරණයේ වගකිවයුත්තකු ලෙස (ආ) තමාට බලපාන පරිපාලන නිතිරීති ඉහළ කළමනාකාරීත්වය කෙරෙහි තමා සතු වගකීම් පිළිබඳ මනා දැනුමක් ලබාගෙන එම කළමනාකරණ උපදෙස් පිළිපැදීම යන කාරණය දක්වා සිටියද වගඋත්තරකරු මෙහිදී එලෙස ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය වී ඇත.

13. එම චක්‍රලේඛනය 6 හි දක්වා ඇති පරිදි එම ආචාර ධර්ම වුවමනාවෙන්ම පැහැර හරින සාමාජිකයන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියාමාර්ග ගත හැකි නිති මාලාවක්ද ඇතුළත් වන බවද සඳහන් කර ඇත.

**නිගමනය :-**

ඒ අනුව 2005/17 චක්‍රලේඛනය ප්‍රකාරව කටයුතු නොකර අත්තනෝමතිකව වෙනත් පාසලක් ලබා ගැනීමට දෙමාපියන්ට දැන්වීම තුළින් ශිෂ්‍යයාගේ අධ්‍යාපන අයිතිය මාස 3 ක පමණ කාලයකට අහිමි කිරීම තුළින් අදාළ අභිප්‍රේතියට පත් නැනැත්තාට නීතියේ රැකවරණය අහිමි වී ඇති බවත් ඒ තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති නීතියේ සම රැකවරණයට ඇති අයිතිය මෙම සිසුවා සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවත් මෙම පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

1 ඒ අනුව මෙම ශිෂ්‍යාට කිසිදු බාධාවකින් තොරව වගඋත්තරකාර කැළණිය ශ්‍රී ධර්මාලෝක විද්‍යාලයේම අධ්‍යාපනය හැදෑරීමට අවකාශය ඇති කිරීමට වහාම කටයුතු කළ යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරමු.

2. පාසල් ප්‍රධානින් 2005/17 චක්‍රලේඛනය හා 2012/17 චක්‍රලේඛන ප්‍රකාරව කටයුතු නොකර අත්තනෝමතිකව කටයුතු කිරීම වැලැක්වීම සඳහා මෙම චක්‍රලේඛන පිළිබඳ විධිමත් දැනුවත් භාවයක් ලබාදීමට කටයුතු කිරීමට අධ්‍යාපන බලධාරීන් දැනුවත් කිරීම සුදුසු බව අධ්‍යාපන ලේකම්වරයා වෙත දන්වා සිටින අතර. ඒ අනුව කටයුතු කරන ලෙසට නිර්දේශ කරමු.

2016.08.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- ලේකම්, - ඉහත නිර්දේශයේ (2) පරිදි කටයුතු කිරීමට
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/..